සභාපති

ප්‍රසම්පාදන කමිටුව

පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**<u>පේරාදෙණිය විශ්වවිද්‍යාල පශු වෛද්‍ය පීඨයේ සත්ව ගොවිපල සඳහා කම්කරු සේවය සැපයීම - 2022/2023</u>**

මෙම කොන්ත්‍රාත්තුවේ නියමයන් හා කොන්දේසි සම්බන්ධ කරුණු මා විසින් කියවා තේරුම්ගත් අතර, එම නියමයන් හා කොන්දේසිවලට බැඳී සිටීමට මම එකඟ වෙමි.

1) i. කොන්ත්‍රාත්කරුගේ නමඃ ……………………………………………………………..……….

ii. ව්‍යාපාරයේ (තනි පුද්ගල/හවුල් ව්‍යාපාර/සමාගම්) නමඃ ……………………………………………..

2) ලිපිනය : ………………………………………………………………………………

………………………………………………………………………………..

3) දුරකතන අංකය : ……………………………………………………………………..

4) ලංසු සුරක්ෂිතයේ වටිනාකම : ………………………………………………………..

5) වැට් බදු ලියාපදිංචි අංකය : ………………………………………………………………….

(බදු සඳහා ලියාපදිංචි වී නොමැති අයදුම්කරුවන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා ගෙන් ඒ බව සනාථ කෙරෙන ලිපියක් ලබා ගෙන එය ලංසු පත්‍රිකාව සමÛ අමුණා එවිය යුතුය)

6) ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය :…………………………………………………………….

7) **<u>පේරාදෙණිය විශ්වවිද්‍යාල පශු වෛද්‍ය පීඨයේ සත්ව ගොවිපල සඳහා කම්කරු සේවය සැපයීම සඳහා මිල ගණන්</u>**

| **අනු අං.** | **සේවක ශ්‍රේණිය** | **සේවක සංඛ්‍යාව** | **දින ගණන** | **මුළු සේවක දින ගණන (A)** | **එක් සේවකයෙකු සඳහා දෛනික ගෙවීම්** | | | | | **සියළුම සේවකයින් සඳහා අයකිරීම් C= (A x B)** |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | **මූලික වැටුප (w)** | **සේවක අර්ථ සාධක අරමුදල (x)** | **සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල (y)** | **එක් සේවකයෙකු සඳහා ලාභය (z)** | **(දෛනික වැටුප B = (w+x+y+z+)** | |
| 1 | කම්කරු | පිරිමි - 06 | 365 | 2190 | ……... | …… | ……… | …….. | ………… | …………… |
| | | ගැහැණු- 06 | 365 | 2190 | ……... | …… | ……… | …….. | ………… | …………… |

| | |
|---|---|
| **වාර්ෂික කොන්ත්‍රාත් වටිනාකම (බදු රහිත)/ ඉලක්කමින් - රු.** | …………………………………………… |
| **අකුරෙන් - රු.** | ……………………………………………. …………………………………………… |
| VAT 15 % රු. | ……..…………………………………… |
| **වාර්ෂික කොන්ත්‍රාත් වටිනාකම {බදු සහිත} රු.** | …………………………………………… ……………………………………… |

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය**

**පේරාදෙණිය විශ්වවිද්‍යාල පශු වෛද්‍ය පීඨයේ සත්ව ගොවිපල සඳහා කම්කරු සේවය සැපයීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨ සත්ව ගොවිපල සඳහා කම්කරුවන් 12 දෙනෙකුගේ සේවය සැපයීම සඳහා (පිරිමි 06, ගැහැණු 06) විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිතුමා විසින් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

ආපසු නොගෙවනු ලබන රු.2,000/- ක ටෙන්ඩර් ගාස්තුවක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා 2022.09.19 දින සිට එම අංශයෙන් ටෙන්ඩර්පත් ලබා ගත හැකිය.

***ටෙන්ඩර් කොන්දේසි***

1. ටෙන්ඩර්පත් 2022.10.11 වැනි දින පස්වරු 01.00 ට හෝ ඊට පෙර ලැබෙන ලෙස **"සභාපති, විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ලේඛකාධිකාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදු කළ යුතු වේ.

2. ටෙන්ඩර්පත්වල මුල් පිටපත සහ එහි අනු පිටපතක් ඉල්ලා ඇති සියළුම ලේඛන සමඟ අමුණා වෙන් වෙන්ව හා සුරක්ෂිතව මුද්‍රා තැබූ ලියුම් කවරවල හෝ ඇසුරුම් වල (Packages) බහාලිය යුතු අතර, එහි ඉහළ වම් කෙළවරේ මුල් පිටපත හා අනු පිටපත ලෙස පිළිවෙලින් සටහන් කළ යුතුය. එම ලිපි කවර දෙකම එකම ඇසුරුමක බහා සුරක්ෂිතව මුද්‍රා තබා එම ලිපි කවරයේ වම් කෙළවරේ " **පේරාදෙණිය විශ්වවිද්‍යාල පශු වෛද්‍ය පීඨයේ සත්ව ගොවිපල සඳහා කම්කරු සේවය සැපයීම 2022/2023** " ලෙස සටහන් කොට ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ලේඛකාධිකාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදු කළ යුතු වේ.

3. ටෙන්ඩර්පත් විවෘත කිරීම 2022.10.11 වැනි දින පස්වරු 01.30 ට පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය සනාතන මන්දිරයේ කමිටු ශාලා අංක II දී සිදුකරනු ඇත.

4. නියමිත දිනයේ නියමිත වේලාවෙන් පසුව ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

5. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවට සැපයුම්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැකිය.

6. ටෙන්ඩර් ස්ථාවර විය යුතු අතර වෙනස්වීම්වලට භාජනය නොවිය යුතුය.

7. කම්කරුවන් සැපයීම සම්බන්ධයෙන් සැපයුම්කරු සතු පළපුරුද්ද පිළිබඳ ලිඛිත සනාථ කිරීම් ටෙන්ඩර් පත්‍ර සමග එවිය යුතු අතර අදාළ ආයතන විසින් ලබා දෙන සේවා සහතික පිළිබඳ ලිඛිත තහවුරු කිරීම්ද ටෙන්ඩර්පත් සමග අමුණා එවිය යුතුය.

8. සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම සම්බන්ධයෙන් ලිපි ලේඛන ඇත්නම් එම ලිපි ලේඛන ද ටෙන්ඩර් පත්‍ර සමග එවිය යුතුය.

9. ටෙන්ඩර්පත, විවෘත කළ දිනයේ සිට අවම වශයෙන් දින 90 ක කාල පරිච්ඡේදයක් සඳහා වලංගු විය යුතුය.

10. සියළුම ලංසුපත් සමග වාර්ෂික ලංසු වටිනාකමින් (බදු රහිත) 1% ක වටිනාකමකින් යුත් ලංසු සුරක්ෂිතයක් 2022.10.11 දින සිට දින 120 ක කාල පරිච්ඡේදයක් සඳහා වලංගු වන පරිදි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ නමින් (ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි පිලිගත් රාජ්‍ය හෝ වාණිජ බැංකුවකින් ලබා ගත්) ලබා ගත් ලංසු සුරක්ෂිතයක් හෝ ඊට සමාන මුදලක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සරප් අංශයට ගෙවා ලබාගත් රිසිට්පත ටෙන්ඩර්පත් සමග අමුණා එවිය යුතුවේ. ( දින 120 කින් ආපසු ගෙවන) රක්‍ෂණ සමාගම් මගින් ඉදිරිපත් කරනු ලබන ඇප සුරක්‍ෂිත හෝ චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

11. මෙම කොන්ත්‍රාත්තුව සඳහා තෝරා ගනු ලබන ලංසුකරු තම වාර්ෂික ලංසු වටිනාකමින් (බදු රහිත) 10% ක් වටිනා කාර්ය සාධන සුරක්‍ෂණ තැන්පතුවක් (ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි පිලිගත් රාජ්‍ය හෝ වාණිජ බැංකුවකින් ලබා ගත්) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති නමින් දින 390 ක කාල පරිච්ඡේදයකට වලංගු වනසේ (කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන දින සිට) ලබා දිය යුතුය.

12. මීට අමතරව තෝරා ගනු ලබන කොන්ත්‍රාත්කරුවන්, තමා විසින් සේවයේ යොදවනු ලබන සේවකයින් විශ්වවිද්‍යාලය තුළ සේවා කටයුතු වල නියැලීමේදී සිදුවන හදිසි අනතුරු ආදිය ආවරණය කිරීම සඳහා වාර්ෂික කොන්ත්‍රාත් මුදලට (බදු රහිත) සමාන වටිනාකමකින් යුත් රක්ෂණාවරණයක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති නමින් දින 390 ක කාල පරිච්ඡේදයකට වලංගු වනසේ (කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන දින සිට) ලබා දිය යුතුය.

13. සෑම ලංසු අයදුම් පත්‍රිකාවක් සමගම පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

    i. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය.

    ii. වැට් බදු ලියාපදිංචි සහතිකයේ පිටපතක් හෝ බදු සඳහා ලියාපදිංචි වී නොමැති නම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා ගෙන් ඒ බව සනාථ කෙරෙන ලිපිය.

    iii. මූල්‍ය ශක්‍යතාව (Financial stability) තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි (ආසන්න වසර 03 ක විගණනය කරන ලද මූල්‍ය වාර්ථා, බැංකු අයිරා පහසුකම් පිලිබඳ ලියකියවිලි ආදිය)

    iv. රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා ආසන්න වසර 03 ක සේවා සැපයීම් තහවුරු කිරීමේ ලේඛන.

**සේවා කොන්දේසි:**

01. සේවය සඳහා කම්කරුවන් යෙදවූ දින ගණනට පමණක් ගෙවීම් කරනු ලැබේ.

02. සැපයුම්කරු කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ පළමු දිනයේ සිටම විශ්වවිද්‍යාලය විසින් ඉල්ලුම් කළ කම්කරු සංඛ්‍යාව සැපයිය යුතු වේ.

03. තෝරා ගන්නා ලද ලංසුකරු අදාළ සේවය සැපයීම වෙනුවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමග ගිවිසුමකට එළඹිය යුතුය.

04. දිනපතා ගොවිපලේ රාජකාරි සඳහා පිරිමි කම්කරුවන් 06 දෙනෙකු හා ගැහැණු කම්කරුවන් 06 කු සැපයිය යුතුය. එම සේවය කොන්ත්‍රාත් කාලය පුරාම (නිවාඩු දිනද ඇතුළත්ව) අනිවාර්යයෙන්ම ලබා දිය යුතු වේ.

05. **සත්ව ගොවිපල ආශ්‍රිත සේවාවන්හි පළපුරුදු සැපයුම්කරුවන් පමණක් මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.** ඔබ සපයන කම්කරුවන් සතුන්ගේ ගාල් සෝදා පිරිසිදු කිරීම, සතුන්ට ආහාර දීම, කිරි දෙවීම ඇතුළු අනෙකුත් ගොවිපලක කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති අය විය යුතු අතර ඊට අදාල වැඩ කොටස් ඔවුන් විසින් ඉටු කල යුතුය. සැපයුම්කරුවන් ඔවුන් විසින් සපයනු ලබන සේවකයන්ගේ නිපුණතාව පිළිබඳ සම්පූර්ණයෙන් වගකිව යුතු අතර සත්ව ගොවිපල ආශ්‍රිත සේවාවන් ඉටුකිරීම සම්බන්ධයෙන් සේවා සහතික ආදියෙහි ලිඛිත සනාථ කිරීම් අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුවේ.

06. විශ්වවිද්‍යාලය විසින් ඉල්ලීම් කර ඇති දිනකට සැපයිය යුතු කම්කරුවන් ප්‍රමාණයම දිනපතා රාජකාරි සඳහා අනිවාර්යයෙන්ම යෙදවිය යුතු අතර, එසේ නොවන විට නොපැමිණෙන එක් කම්කරු සේවකයකු සඳහා දෛනිකව රු.500.00 ක බැගින් දඩයක් මාසික බිල්පතින් අඩු කරනු ලැබේ.

| | සේවා කරන පුද්ගලයින් | කාලය | |
|---|---|---|---|
| 01. | සාමාන්‍ය රාජකාරි සඳහා 10 දෙදෙනකු යෙදවිය යුතුය | පෙරවරු 7.30 | පස්වරු 4.30 |
| 02. | කිරි දෙවීම සඳහා යොදවන ලද පුද්ගලයන් දෙදෙනකු යෙදවිය යුතුය | පෙරවරු 3.00<br>පස්වරු 1.30 | පෙරවරු 7.00<br>පස්වරු 5.30 |

07. ඉහත සේවා කරන ලද කාලයට ආහාර ගැනීම සහ තේ පානය සඳහා පැයක කාලයක් ඇතුළත් වේ) කෙසේවෙතත් සැම පුද්ගලයකුටම පැය 08 සේවා මුරයක් කිරීමට ඇති අතර විශේෂයෙන්ම කිරි දෙවීම සඳහා යොදවන පුද්ගලයන් පළපුරුදු කිරි දොවන්නන් විය යුතුය.

08. පශු වෛද්‍ය පීඨ සත්ව ගොවිපල හා සත්ව නිෂ්පාදන අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානගේ නියමය පරිදි සේවා සැපයීමට කොන්ත්‍රාත්කරු කටයුතු කල යුතු අතර අමතරව කරන සෑම සේවාවක් සඳහා ගෙවන මුදල පශු වෛද්‍ය පීඨ සත්ව ගොවිපල හා සත්ව නිෂ්පාදන අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානගේ අනුමැතිය අනුව වැඩ කල පැය ගණන ගුණ කොට ගෙන ගණනය කරනු ඇත. කෙසේ වෙතත් ඒ සඳහා වන අමතර ගෙවීම් විශ්වවිද්‍යාලය විසින් අනුමත කර ඇති මුළු ටෙන්ඩර් මුදල නොඉක්මවිය යුතුවේ.

09. කම්කරුවන් වැඩ කිරීමේදී භාවිතා කරන උපකරණ උදාහරණ : දෑකැති, උදලු, පිහියා, අත් මේස්, වැහි කබා, සබන්, උස සපත්තු, විල්බැරෝ ආදිය සැපයුම්කරු විසින් සපයා දිය යුතුය.

10. කම්කරුවන් වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදල් ගාස්තු හා සේවක භාරකාර අරමුදල් ගාස්තු ගෙවීම කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු අතර වැඩබිමේදී කම්කරුවන්ට වන කිසිදු අනතුරකට හෝ හානියකට වගකීමට හෝ වන්දි ගෙවීමට හෝ විශ්වවිද්‍යාලය බැඳී නොසිටී.

11. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ සේවකයන්ගේ අනන්‍යතාව, ඔවුන්ගේ පැවැත්ම හා හැසිරීම පිළිබඳව සැපයුම්කරු සම්පූර්ණයෙන්ම වගකිව යුතු වේ.

12. මෙම ටෙන්ඩරය ප්‍රදානය කළ දිනයේ සිට දින 365 ක කාලයක් සඳහා වලංගු වේ.

13. කම්කරුවන් සේවය කිරීමේදී සතියේ දින 07ම සේවය කල යුතු අතර පශු වෛද්‍ය පීඨයේ අලෙවි මධ්‍යස්ථානය සදහා යෙදෙවන ලද කම්කරු මහාතා ඉරිදා දින පමණක් එම මධ්‍යස්ථානය වසා තැබෙන හෙයින් අවශ්‍ය නොවේ.

14. පවරන ලද කාර්යයේ අපේක්ෂිත තත්ත්වය හෝ නිපුණතාව නොමැති කම්කරුවන් ඉවත් කිරීමේ බලය විශ්වවිද්‍යාලය සතු වන අතර , සැපයුම්කරු විසින් ඒ සඳහා වෙනත් කම්කරුවෙකු අප්‍රමාදව අනුයුක්ත කළ යුතු වේ.

15. සැපයුම්කරු විසින් වයස අවුරුදු 18 ට වැඩි 60 ට අඩු පුද්ගලයන් පමණක් සේවයේ යෙදවිය යුතු අතර කායිකව හා මානසිකව යෝග්‍ය නොවූ පුද්ගලයන් කම්කරු සේවාව සඳහා සේවයේ නොයෙදිය යුතුය.

16. සැපයුම්කරු විසින් සේවකයන්ගේ කටයුතු, ගොවිපලේ කටයුතු නිරන්තරයෙන් සොයා බැලීම සිදු කල යුතුය

17. අවශ්‍ය අවස්ථාවන්හිදී සේවා මුර ක්‍රමයට හා රාත්‍රි කාලයේදී ද සේවය කිරීමට කම්කරුවන් සැපයීමට සැපයුම්කරුට හැකි විය යුතුය.

18. සේවකයන්ගේ පැමිණීමේ හා බැහැර යාමේ ලේඛනයක් අදාළ සේවා ස්ථානයේ අංශ ප්‍රධානි විසින් නියම කරනු ලබන ස්ථානයක පමණක් පවත්වාගෙන යා යුතුවේ.

19. සේවක සේවිකාවන් අනිවාර්යයෙන්ම අදාළ නිල ඇඳුමින් සැරසී සිටිය යුතුය.

20. විශ්වවිද්‍යාලයෙන් නියමිත මාසික ගෙවීම් ලැබෙනතෙක් සැපයුම්කරු විසින් කම්කරුවන්ට වැටුප් ගෙවීමට කටයුතු කළ යුතු අතර, ඒ සඳහා වත්කම් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කල යුතුය.

21. කිසියම් කම්කරුවෙකු විසින් විශ්වවිද්‍යාල දේපළ වලට යම් අලාභයක් සිදුකළ හොත් එම වටිනාකම සැපයුම්කරු සමග ගිවිසගත් මුදලින් අඩු කිරීමට පියවර ගනු ලබනු ඇත.

22. තෝරා ගන්නා සැපයුම්කරු ඉහත කොන්දේසිවලට තම සේවාව ලබා දිය යුතුය. ඔබ සපයනු ලබන සේවාව පිළිබඳ විශ්වවිද්‍යාලය සෑහීමකට පත් නොවන්නේ නම් ඒ පිළිබඳව ලිඛිතව දැනුම් දෙන අතර, මසක කල් දීමකින් පසුවද සේවය අසතුටුදායක නම් නැවත නොදන්වා සේවය අවසන් කරනු ලැබේ

නියෝජ්‍ය ලේඛකාධිකාරී/පාලන
පේරාදෙණිය විශ්වවිද්‍යාලය